(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 3(4).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2011 මැයි මස 26 වැනි බ්‍රහස්පතින්දා**

## 2011 ජූනි මස 07 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 16 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 16 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම — කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000<br>රු. 300,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 260,000,000<br>රු. 300,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 17 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 17 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01602 "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම — අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,500,000 සිට<br>රු. 400,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 18 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 18 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම — රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 120,000,000<br>105,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.<br>රු. | 0<br>20,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 19 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 19 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම — ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,300,000,000<br>රු. 1,800,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 4,067,000,000<br>රු. 4,750,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 500,000,000<br>රු. 800,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 20 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 20 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 23202 "බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම — බන්ධනාගාර දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 153,000,000<br>රු. 89,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 175,000,000<br>රු. 98,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 24 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 24 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම — රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 5,550,000 සිට<br>රු. 4,700,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 25 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 25 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25003 "විවිධ අත්තිකාරම් ගිණුම — රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 50,000,000<br>රු. 30,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 250,000,000<br>රු. 37,200,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 200,000,000<br>රු. 560,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.21 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8),— 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 7 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම, පරිවර්තන ගාස්තු හා කාර්යය මණ්ඩලය වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 3,800,000,000<br>රු. 1,900,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 1,000,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2010.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2011.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*

නාවික හමුදා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.05.25 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2011.04.21 දිනැති අංක 1702/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3), 14 සහ 20 වැනි වගන්ති යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 21 දිනැති අංක 1702/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8(2) වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි 14 දිනැති අංක 1536/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් එකී පනතේ 8 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ කාර්ය සඳහා විශේෂඥ මණ්ඩලයට තැනැත්තන් සහ ආයතනය පත් කරමින් සාදන ලදුව 2010 ඔක්තෝබර් 28 දිනැති අංක 1677/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2011 ජුනි මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0040/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා රජයට ණය මුදල් ලබා දී ඇති රටවල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ බැංකු සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට ගෙවීමට ඉතිරිව තිබෙන ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1999 වර්ෂය අවසාන වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී රටවල් හෝ ආයතන විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(v) ණය පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාල පරිච්ඡේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ලබාගෙන ඇති ණය මුදල්ද සමග වර්ෂ 2000 සිට 2015 දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සම්පූර්ණ ණය ක්‍රමක්ෂය (මුල් ණය මුදල සහ පොලී ගෙවීම්) කොපමණද;

(ii) ඉහත දක්වා ඇති දත්ත ඇමරිකානු ඩොලර්වලින් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0330/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ 20 ක කාලය තුළ මහාමාර්ග ඉදි කිරීම සඳහා වාර්ෂිකව පවරා ගත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද;

(iii) එයින් දැනටමත් ගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) එම මුදල් ගෙවා නිමකරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0800/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) දැනට ක්‍රියාත්මක වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දාහතකින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හා සීමාවාසික පුහුණුව සාර්ථකව නිමකළ, මෙතෙක් ගුරු පත්වීම් නොලැබූ ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විශාල පිරිසක් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 දෙසැම්බර් සිට මේ දක්වා ගුරු පත්වීම් නොලබා සිටින එම ඩිප්ලෝමාධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පත්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් මේ වන විට සකසා තිබේද;

(iii) එසේ නම්, 2010 හා 2011 වර්ෂ තුළ පත්වීම් ලබා දෙනු ලබන ගුරු සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 හා 2011 වර්ෂවලදී එම පත්වීම් ලබා දෙන දින වකවානු කවරේද;

(v) එම පත්වීම් ලබා දීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, 2010 හා 2011 වර්ෂ සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම ප්‍රතිපාදනයන් වෙන්කරන ලද වැය ශීර්ෂ හා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1174/’11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන සියල්ල මේ වන විට ලේඛනගත කර තිබේද;

(ii) එම ස්ථාන බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා වෙනත් ආගමික ස්ථාන වශයෙන් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0582/’10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට ක්‍රියාත්මක වන සියලුම බ්‍රෝඩ්බෑන්ඩ් (පුළුල් තරංග මාලා) සේවා සපයන්නන්ගේ නම් කවරේද;

(ii) එම සමාගම්වල හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iii) එම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් වෙත ලබාදී ඇති තරංගමාලා සංඛ්‍යාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන කාර්යාලවල සේවය කරන සේවකයන්ගේ සංඛ්‍යාව කවරේද;

(ii) බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් සිය මෙහෙයුම් ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සපයන්නන් විසින් ගෙවන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0933/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව, ඒවායේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම මධ්‍යස්ථානවල ක්‍රියාත්මක විෂය නිර්දේශයන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියමයන්ට අනුව සකස් කර තිබේද;

(ii) නොඑසේ නම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂය නිර්දේශයන්ට අනුව එම විෂය නිර්දේශ සකස් කරනු ලබන්නේද;

(iii) ඒවායේ සේවයේ නියුතු ගුරුවරුන් සඳහා නිත්‍ය සේවා තනතුරක් ඇති කර ඔවුන් එම තනතුරෙහි ස්ථිර කිරීමට සහ විධිමත් වැටුප් ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0958/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004.06.04 දිනැති අංක 1344 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අනුරාධපුර රාජධානි භූමියේ යාර 400 රෙගුලාසියට යටත්ව කිසිදු ඉදිකිරීමක් නොකළ යුතු බවට නීති සකසා තිබිය දී එයට පටහැනිව අනවසර ඉදි කිරීම් සිදු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ඉදිකිරීම් කවරේද;

(ii) ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එවැනි අවසරයක් ලබා දුන් නිලධාරීන්ගේ නම් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර පූජා නගරයේ ඇතුළු දිය අගල කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සිදුකරනු ලබන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ද නැතහොත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය මත වෙනත් පාර්ශ්වයක් විසින්ද;

(iii) වෙනත් පාර්ශ්වයක් විසින් නම්, ඒ කවරුන්ද;

(iv) එම ව්‍යාපෘතිය සිදු කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ජාතික උරුම නගරයක් වන අනුරාධපුර පූජා නගරය තුළ සිදු කරනු ලබන මෙවැනි අත්තනෝමතික ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1175/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු නැගෙනහිර පළාත්වල ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන නිදන් හොරුන් විසින් විනාශ කරන බව එතුමා දන්නෙහිද?

(ආ) එම ස්ථාන නිදන් හොරුන්ගෙන් සහ අනෙකුත් ආපදාවලින් රැක ගැනීමට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0692/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල යෙදී සිටින රටවල නම් කවරේද;

(ii) බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ඉහත රටවලට ලබා දී ඇති උතුරු සහ නැගෙනහිර පළාතේ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් වර්ග කිලෝමීටර කොපමණද;

(iii) අද වන විට බිම් බෝම්බ ඉවත් කර ඇති භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරන ලද වියදම කොපමණද;

(ii) බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ලැබුණු ප්‍රදානයන් කොපමණද;

(iii) ඉහත සඳහන් ප්‍රදානයන් ලබාදුන් රටවල හෝ පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(iv) උතුරු නැගෙනහිර ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට ගතවන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0934/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පළාත් පාලන ආයතනවල බලප්‍රදේශයන්ට අයත් භූමි ප්‍රමාණයන් වෙන වෙනම දළ වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iv) 2009 ඡන්දහිමි නාම ලේඛනය අනුව මාතර දිස්ත්‍රික්කයේ සිටින ලියාපදිංචි ඡන්ද දායකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජන සංඛ්‍යාව, ජන සංයුතිය හා භූගෝලීය පිහිටීම සළකා පළාත් පාලන ආයතන සංඛ්‍යාව අඩු හෝ වැඩි කිරීමට ඉදිරියේදී කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, නව පළාත් පාලන ආයතන සීමා නිර්ණය කරනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0959/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් ආයතනය ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා කැසිනෝ ශාලා වෙතින් රජයට ලැබුණු බදු ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කැසිනෝ ශාලාවක් ආරම්භ කිරීමට බලපත්‍රයක් ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර ලබාදීමේදී අවසන් අනුමතිය ලබා දෙන්නා කවරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී කැසිනෝ ශාලා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කවරේද;

(ii) ඒ අතරින් බලපත්‍ර ලබා දෙන සංඛ්‍යාව කවරේද;

(iii) එසේ බලපත්‍ර ලබන අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෝට්ටේ ජාතික සේවක සංගමයේ මූලස්ථානය පවත්වාගෙන යන භූමිය පුරා විද්‍යාත්මකව වැදගත් ස්ථානයක් බවත්;

(ii) එම භූමිය තුළ කෝට්ටේ රාජධානියට අයත් පුරාවිද්‍යාත්මක ස්මාරක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම වටිනා පුරාවිද්‍යා භූමිය නිදහස් කර ආරක්ෂාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූනි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0041/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, එම ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජය මගින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'11

ගරු තිස්ස අත්තනායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්ව තැපැල් දිනය වෙනුවෙන් 2010.10.04 වැනි දින කටුබැද්ද ජාතික ආධුනිකත්ව මණ්ඩල ශ්‍රවණාගාරයේදී උත්සවයක් පැවැත්වූ බවත්;

(ii) ඊට අමතරව එම දිනය සැමරීමට තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් ජෙට් ලයිනර් නැවේ රාත්‍රී භෝජන සංග්‍රහයක් සහිතව සුහද හමුවක් පැවැත්වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සාදය සඳහා තැපැල් දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

(ii) එසේ මුදල් වියදම් කිරීමට නිසි පරිදි අනුමතිය ලබා ගෙන තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාර්ෂිකව රුපියල් බිලියන 26ක පමණ පාඩුවක් ලබන තැපැල් දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතා සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට තිබියදී එය පසෙකලා මෙලෙස මුදල් වියදම් කිරීම අසාධාරණ බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0584/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ හතරක කාලය තුළ ද්විපාර්ශ්වික පදනම මත මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමට ලබාදෙන කාලය සහ ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාල සීමාව සම්බන්ධයෙන් කරන ලද අලුත්කිරීම් කවරේද;

(ii) එවැනි පහසුකම් ලබාදෙන ලද දිනය කවරේද;

(iii) එවැනි පහසුකම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) ඉහත කී ණය මුදල් සම්බන්ධයෙන් කිසියම් ආරම්භක ගාස්තුවක්, පොරොන්දු ගාස්තුවක්, කළමනාකරන හෝ පරිපාලන ගාස්තුවක්, රක්ෂණ වාරිකයක්, සහ හෝ වෙනත් කිසියම් නම්වලින් හැඳින්වෙන පිරිවැයක් දැරීමට සිදුවී තිබේද;

(v) එක්වර ගෙවිය යුතු ගෙවීම් හෝ වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් තිබේද;

(vi) පිරිවැය සාධකයක් ලෙස රට කෙරෙහි බලපෑමක් ඇති කරන ඉහත කී ගෙවීම් සඳහා වර්ෂයකට ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0960/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිතාවන දුරකථන ජාලයන් හරහා සිදුවන දෙබස්වලට සවන්දීම හෝ පටිගත කිරීම සඳහා උපකරණ පද්ධතියක් රජයෙන් හෝ යම් ආයතනයක් විසින් මෙරටට ගෙන්වා හෝ ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එහි වටිනාකම කොපමණද;

(iii) එම පද්ධතිය මගින් ආවරණය වන දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි පද්ධතියක් ගෙන්වීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1172/'11

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපි වෙනුවෙන් අපි රණ විරු අරමුදලේ බලධාරීන් විසින් එම ව්‍යාපෘතිය යටතේ මුදල් එකතුකර රණ විරුවන් සඳහා නිවාස ඉදිකිරීමට පියවර ගන්නා බව මාධ්‍ය මගින් රටට ප්‍රකාශ කරන ලද බවත්;

(ii) ඒ අනුව එම අරමුදල සඳහා දේශීය මෙන්ම විදේශීය පරිත්‍යාගශීලීන් විසින් රණ විරුවන් වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් පරිත්‍යාග කර ඇති බවත්;

(iii) මෙම වැඩපිළිවෙළ යටතේ ඉපලෝගම රණජයපුර ඉදිකරන ලද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලබා දීමේදී රණවිරුවන්ගෙන් මුදල් අය කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රණ විරුවන් සඳහා නොමිලේ නිවාස ඉදිකර දෙන බව ප්‍රකාශ කරමින් මුදලට නිවාස ලබා දීමත්;

(ii) මුදල් ගෙවීමට අකමැති වූ රණවිරුවන් එම නිවාසවලින් ඉවත් කිරීමත්;

සාධාරණ නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0720/'10

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අතුරු නිෂ්පාදනයක් වන ගෑස්, ලාෆ්ස් ගෑස් සමාගම වෙත ලබාදීම සඳහා වන ගිවිසුමකට එම සංස්ථාව අත්සන් කළ දිනය කවරේද;

(ii) මෙම ගිවිසුම අත්සන් කරනු ලැබුවේ කවර පදනමක් යටතේද;

(iii) ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමෙන් අනතුරුව එම ගිවිසුමට අත්සන් කරනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, එය සිදුකළ ආකාරය කවරේද;

(v) එවැනි ගිවිසුමක් පිළිබඳව තීරණ ගැනීමට සහ එවැනි ගිවිසුමක් අත්සන් කිරීමට බලය පවරා ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

(vi) ඉහත කී සමාගම විසින් සපුරාලිය යුතු කොන්දේසි සහ ඔවුන් විසින් විකුණන ගෑස්වල මිල කවරේද;

(vii) ගිවිසුමට අනුව සමාගම විසින් සපුරා නොමැති කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෑස් අලෙවිකිරීමේ කටයුතු ආරම්භ කළ හැකිද;

(ii) එලෙස අලෙවි කළ හැකි නම්, එසේ නොකර සිටීමට හේතු කවරේද;

(iii) සංස්ථාවට ගෑස් අලෙවිකිරීමට ඇති බාධා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව තෝරාගත් එක් සමාගමකට පමණක් ගෑස් අලෙවිකිරීම නිසා මෙම ගිවිසුමේ දිනයේ සිට මේ දක්වා වාර්ෂිකව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අහිමි වූ ආදායම කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0937/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 ජූනි සිට 2010 ජූනි දක්වා වර්ෂ 5 තුළ මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා වෙන් වෙන් වශයෙන්, වාර්ෂිකව,

(i) සමෘද්ධිලාභීන්ට සහනාධාර ලබා දීම සඳහා වැය කළ මුදල;

(ii) සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් සංඛ්‍යාව;

(iii) ආර්ථිකය වර්ධනයවීම හේතු කොටගෙන සමෘද්ධි සහනාධාර පත්‍ර නැවත රජයට භාරදුන් සමෘද්ධිලාභීන්ගේ සංඛ්‍යාව;

(iv) අලුතින් සමෘද්ධි සහනාධාර ලබා දුන් පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0961/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්, දැනට ශිෂ්‍යාධාර ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශිෂ්‍යාධාර ලබන සිසුවෙකුට එක් මාසයකදී සඳහා ශිෂ්‍යාධාර ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) එක් වර්ෂයක් තුළ ශිෂ්‍යාධාර ගෙවනු ලබන මාස ගණන සහ එක් සිසුවෙකු වෙනුවෙන් ශිෂ්‍යාධාර ගෙවනු ලබන වර්ෂ ගණන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යාධාර ගෙවීමට මාසයේ නිශ්චිත දිනයක් වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) 2010 වර්ෂයේ එක් එක් මාසය සඳහා ශිෂ්‍යාධාර ලබා දීමට වෙන් කළ දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී නිසි පරිදි නියමිත කාල සීමාවට අනුව ශිෂ්‍යාධාර ගෙවා නොමැති බවත්;

(ii) එබැවින් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් ශිෂ්‍යාධාරලාභී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි කරගෙන යාමට නොහැකි තත්ත්වයක් පැන නැගී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/'11

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් නිකුත් කරන ලද 6/2010 විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛයට අනුව 85% විශ්‍රාම වැටුප් හිමි වන්නේ ක්‍රියාන්විත ප්‍රදේශවල වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්‍රාමික රණවිරුවන්ට පමණක් බවත්;

(ii) ත්‍රිවිධ හමුදා නිලධාරීන් ලංකාවේ විවිධ පළාත්වල සේවය කරන්නේ ඔවුන්ගේ පුද්ගලික කැමැත්ත මත නොව විවිධ අවස්ථාවලදී අදාළ හමුදාවේ පරිපාලන සේවා අවශ්‍යතා මත බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිවිධ හමුදාවේ සියලුම නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේදී එක හා සමානව සැළකිය යුතුබව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, විශ්‍රාම ගැන්වීමේදී ක්‍රියාන්විත සේවා කාලය සළකා විශ්‍රාම වැටුප් ප්‍රතිශතය ගණනය කිරීමෙන් ඇති වන විෂමතාව ඉවත් කිරීමට අදාළ බලධාරීන්ට උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 ජූනි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0217/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ඇසීමට,— (3)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0456/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) කොළඹ නගරය තුළ තිබූ පදික වෙළෙඳුන් සතු සියලුම වෙළෙඳසැල් කඩා දැමීමේ වැඩ පිළිවෙළක් රජය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒවා ඉවත් කරන ලද දිනය සහ ඒවා ඉවත් කළේ කුමන හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සියලුම වෙළෙඳසැල් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒවා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) තවමත් වෙළෙඳසැල් පවත්වාගෙන යන පදික වෙළෙඳුන් සිටින්නේ නම්, එම වෙළඳාම නීත්‍යානුකූල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉවත් කරන ලද පදික වෙළෙඳුන් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දී තිබේද;

(iii) ඔවුන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති විකල්ප ස්ථාන කවරේද;

(iv) කොළඹ නගරය හැර වෙනත් ප්‍රදේශවලත් මෙම ගැටලුව පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) දේශපාලන පළිගැනීමක් සඳහා මෙය සිදුකළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0575/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට එක් එක් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ගේ සංඛ්‍යාව පාසල් වර්ගීකරණය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) පසුගිය අයවැය යටතේ ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 50/2008 හි 2 කොටසේ VI වැනි වගන්තියට යටත් ස්වේච්ඡා ගුරුවරුන් මේ වන තෙක් ස්ථිර සේවයේ පිහිටුවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0808/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස නොමැති පාසල් සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

(ii) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1089/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වන සෙනසුන වැඩසටහන යටතේ වන සෙනසුන් ඇති කිරීම සඳහා සුදුසු ජෛව විවිධත්ව හා සංස්කෘතික වටිනාකමකින් යුක්ත වන ප්‍රදේශ ලෙස මේ වනවිට හඳුනාගත් ස්ථාන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන යටතේ අලුතින් වන සෙනසුන් ඇති කිරීමට පියවර ගත් ස්ථාන කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0762/'10

ගරු රවී කරුණානායක මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර පහ තුළ ඇති වූ ආපදා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් කරනු ලැබූ ක්‍රියාකාරකම් කවරේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට දැනට වෙන්කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් කර ඇති එක් එක් ආපදාවේදී එම ආපදාවේ බලපෑම අවම කිරීමට ගත් නිශ්චිත පියවර කවරේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් පැනනගින ගැටළු විසඳීම සඳහා හිතකර නොවන වාතාවරණයක් නිර්මාණය කරනු ලබන රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සේවකයන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(v) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සේවය කරන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0860/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම්, දිස්ත්‍රික්ක සහ අධ්‍යාපන කලාප මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් ලබාදෙන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) මෙම වැඩසටහන අනුව එක් සිසුවෙකුට දිනකට වෙන්කරනු ලබන මුදල හා ලබාදෙන ආහාර වේල කවරේද;

(v) මෙම වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මකවන ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ පාසල් සඳහා ආහාර සපයන අධ්‍යාපන කලාප ගණනාවකම ආහාර සැපයුම්කරුවන්ට නියමිත පරිදි මුදල් ගෙවා නොමැති බවත්;

(ii) ආහාර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත් හා එමගින් පාසල් සිසුන්ට ආහාර ලබාදීමේ වැඩසටහනට බාධා වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද;

(ii) මේ වනවිට ඔවුන්ට ගෙවා ඇති හිඟ මුදල ඒ ඒ දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0938/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පාසල්වල තොරතුරු තාක්ෂණය සහ පරිගණක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා වර්ෂ 2005 සිට මේ දක්වා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ පරිගණක මධ්‍යස්ථාන ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉදිරි වර්ෂයේදී මාතර දිස්ත්‍රික්යේ පාසල් තුළ නව පරිගණක මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැළසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ යටතේ පරිගණක මධ්‍යස්ථාන ආරම්භ කරන පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) එම මධ්‍යස්ථාන ආරම්භ කිරීමට නියමිත දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0962/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යුද්ධයෙන් පසු උතුරු නැගෙනහිර සංවර්ධන කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ ලබා දුන් රටවල් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් රට ලබා දුන් යන්ත්‍රෝපකරණවල නම් සහ ඒවායේ වටිනාකම එම රටවල් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් යන්ත්‍රය ලබා දී ඇත්තේ ප්‍රදානයක් ලෙසද, ආධාරයක් ලෙසද, නැතහොත් මිල දී ගැනීමක් ලෙසද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත යන්ත්‍රෝපකරණ ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ කවරේද;

(ii) එම එක් එක් බල ප්‍රදේශය සඳහා ලබා දී ඇති යන්ත්‍රෝපකරණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0763/'10

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එයාර් ලංකා" ගුවන් සේවය පෞද්ගලීකරණය කරන ලද දිනය සහ එහි වටිනාකම කවරේද;

(ii) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමේ කොටස් යළි හිමිකරගත් දිනය සහ ඒ සඳහා වැයවූ මුදල් ප්‍රමාණය කවරේද;

(iii) කළමනාකාරීත්වය පවරාගත් දින සිට "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට ප්‍රතිපාදිත මුදල් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම විසින් ලබාගෙන ඇති ණය මුදල්වල වටිනාකම කොපමණද;

(ii) එකී ණය මුදල් ලබාගත් දිනයන් සහ එම ණය මුදල් ලබාගත් ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2017 දක්වා ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ ණය සේවාකරණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 2005 සිට 2011 වර්ෂය දක්වා "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගම ලැබූ ලාභය හෝ පාඩුව කොපමණද;

(v) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී භූමියේදි සිදුකළ භාණ්ඩ මෙහෙයුම් තුළින් ලැබූ ලාභය කොපමණද;

(vi) "ශ්‍රී ලංකන් එයාර්ලයින්" සමාගමට අදාළව රජය විසින් ලබාදී ඇති බැංකු ඇපකර පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0874/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාව ඉරානයෙන් ලබා ගත් ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී ඉරානය, ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන අරමුදල යන ආයතනවලින් ලබා ගත් ණය මුදල් යෙදවූ ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘති සඳහා යෙදවූ මුදල් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ණය මුදල්වලින් ව්‍යාපෘති සඳහා නොයෙදවූ දැනට භාණ්ඩාගාරය සතුව ඇති ප්‍රමාණය කොපමණද;

(v) ඉහත (ii) හි සඳහන් එක් එක් ආයතනයට හෝ රටට ගෙවීමට ඇති ණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ණය ප්‍රමාණයන් ගෙවීමට දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0939/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 327, වලකන්ද බටහිර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි යූ. ජී. ඇඩ්වින් මහතාට නීත්‍යානුකූලව අංක 9001 දරන සින්නක්කර ඔප්පුවකින් හිමිවූ, ඔහුගේ පියා විසින් වර්ෂ 75 කට අධික කාලයක් භුක්ති විඳි අක්කර එකක (01) පමණ කුඹුරු හා ගොඩ ඉඩමට අදාළව 1984 සිට මේ දක්වා කිරින්ද පුහුල්වැල්ල ගොවිජන කේන්ද්‍රයට අක්කර බදු ගෙවා ඇති බවත්;

(ii) මෙසේ නීත්‍යානුකූලව ඔප්පු හා අක්කර බදු ගෙවා තිබියදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කුඹුර වගා නොකරන ලෙස දනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එසේ දැනුම්දීමට හේතුව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම ඔප්පු සහිත ඉඩම්වල පවා වගා කටයුතු අත්හිටුවීම රටේ නිෂ්පාදනය අඩුවීමට බලපාන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, මෙම තත්ත්වය පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඇඩ්වින් මහතාට සිය වගා කටයුතු කර ගැනීමට අවසර ලබාදීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගනු ලබන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1055/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්පිටිය ප්‍රදේශයේ ඇති ශ්‍රී ලංකාවට අයත් දූපත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දූපතේ භූමි ප්‍රමාණය සහ ජීවත්වන ජනගහනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දූපත් අතරින් කුමන හෝ දූපතක් හෝ දූපත් බදු දීමට සැලසුම් කර තිබේ නම්, ඒවායේ වෙසෙන ජනතාව වෙනුවෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 ජූනි මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0130/’10

ගරු රොෂාන් රණසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2005 වර්ෂය වන විට මෙරටේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම නම් වශයෙන්, ඒ ඒ දිස්ත්‍රික්කය අනුව කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආරම්භ කරන ලද ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිවල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව කවරේද;

(iii) ඒ එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ඇති කිරීමට බලාපොරොත්තු වන ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම කවරේද;

(v) ඒ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0475/'10

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද පලාත් පාළන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද පලාත් පාළන ආයතන කවරේද;

(v) ඒවා අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධූරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජනය කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළඹී ඇති නිගමනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0678/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිවන ඉඩම රජය විසින් බදු හෝ වෙනත් ක්‍රමයකට බාහිර පාර්ශ්වයක් වෙත පවරනු ලැබුවේද;

(ii) එසේ පවරා දෙනු ලැබුවේ කවරෙකුටද;

(iii) එම ඉඩම පවරා දුන් මුදල, පැවරුම සිදුකළ වර්ෂය හා ඉඩමේ ප්‍රමාණය කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිය ගොඩනැඟීමෙන් පසු එහි අයිතිය පැවරෙන පාර්ශ්වය කවරෙක්ද;

(v) පවරනු ලබන කාල සීමාව හා මුදල කොපමණද;

(vi) එමගින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල වැය කරනු ලබන්නේ රජය හෝ රජයේ ආයතනයක් විසින්ද; නැතහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හෝ වෙනත් ආයතනයක් විසින්ද;

(iii) එසේ නම්, එක් එක් පාර්ශ්ව විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගනය සහ එහි ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදෙස් ලබා දෙන්නේ කවරුන්ද;

(ii) ක්‍රීඩාපිටිය, ක්‍රීඩා මණ්ඩපය, දිවා රාත්‍රී විදුලි බුබුළු හා වාර්ෂික නඩත්තුව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0810/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1011/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලාංකීය කාන්තා ජනගහනයෙන් විදේශ රැකියාවල නිරත වී සිටින කාන්තාවන්ගේ ප්‍රතිශතය කොපමණද;

(ii) මේ දක්වා විදේශ රැකියාවල යෙදී සිටින අතරතුර ජීවිතක්ෂයට පත්ව ඇති කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එවැනි මරණ අවම කරගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග එක්ව සැකසූ වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1061/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආරම්භ කර ඇති ජාතික පිලිසරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මාතලේ මහ නගර සභාවත් මධ්‍යම පරිසර අධිකාරියත් අතර 2009 වර්ෂයේ ගිවිසුමක් අත්සන් කර ඇති බවත්;

(ii) එම ගිවිසුමට අනුව අදාළ ව්‍යාපෘතිය සඳහා රුපියල් 2,750,000/- ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාතලේ මහ නගර සභාවට ලබා දී ඇති බවත්;

(iii) ගිවිසුමට අනුව 2010 මාර්තු වන විට එම ව්‍යාපෘතිය නිම කළ යුතු වුවද, මාතලේ මහ නගර සභාව මෙතෙක් එය ක්‍රියාත්මක කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත කාලය අවසන් වීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරියට ඒ සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත ගිවිසුම කඩකර තිබියදී මාතලේ මහ නගර සභාවට නැවත එවැනි ගිවිසුමක් අත්සන් කළ හැකිද;

(iii) එසේ නම්, එය පදනම් විය යුතු කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1097/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සඳහා දකුණු පළාත් සභාව විසින් වර්ෂ 2007 දී පවත්වන ලද තරඟ විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ප්‍රදානය කර තිබේද;

(ii) එසේ නම්, එම පත්වීම් ප්‍රදානය කළ දිනය කවරේද;

(iii) එම විභාගයේදී ප්‍රතිඵල අනුව එක් එක් උපාධිධාරියා විසින් ලබා ගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම විභාගයේ ප්‍රතිඵල මත ගුරු පත්වීම් ලැබූවන්ගේ නම් සහ ඔවුන් ලබාගෙන තිබූ ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත විභාගයේ ප්‍රතිඵල අනුව ගුරු සේවයට බඳවා ගැනීම සඳහා යෝජිතව තිබූ කොන්දේසි කවරේද;

(ii) පත්වීම් ප්‍රදානයේදී පෙර යෝජිතව තිබූ කොන්දේසිවල වෙනසක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම වෙනස් කිරීම් හේතුවෙන් ඉහත විභාගයේ ඉහළම ප්‍රතිඵල ලබා ගත් උපාධිධාරීන්ට සිදු වන අසාධාරණය වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0764/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වරාය සංඛ්‍යාව කොපමණද;

(ii) හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ආරම්භක ප්‍රාග්ධනය, වෙනත් දේශීය ප්‍රාග්ධන වෙන්කිරීම් හා වෙන්කරන ලද ණය ප්‍රාග්ධනය කොපමණද;

(iii) උක්ත ව්‍යාපෘතියේ ප්‍රතික්ෂේපිත ණය ක්‍රමක්ෂය 2011 සිට 2018 දක්වා වාර්ෂික පදනමින් කොපමණද;

(iv) ඉදිරි වර්ෂ 5 තුළ විවිධ මූලාශ්‍ර හරහා හම්බන්තොට වරායෙන් ලබාගැනීමට ප්‍රක්ෂේපිත ආදායම වෙන් වෙන් වශයෙන්, වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ණය පියවීම සිදුකරනු ලබන්නේ වරාය අධිකාරිය විසින්ද, නැතහොත් රජය විසින්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0940/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මීට වර්ෂ 15කට පමණ පෙර ආරම්භකර ක්‍රියාත්මක වන කොස්ගහ දොළ ඇල්ල නම් ප්‍රජා ජල ව්‍යාපෘතියක් ඇති බවත්;

(ii) එම ජල යෝජනා ක්‍රමය මේ වන විට දැඩි පරිපාලනමය අකාර්යක්ෂමතාවකට පත්ව ඇති බවත්;

(iii) එම ව්‍යාපෘතිය මගින් සපයන පානීය ජලය පාරිභෝජනයට සුදුසු තත්ත්වයේ නොපවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය පාලනය කරන ආයතනයේ නම කවරේද;

(ii) එමගින් ජලය සපයනු ලබන මුළු කුටුම්භ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම ජල ව්‍යාපෘතියේ පරිපාලනය කාර්යක්ෂම කර පරිභෝජනයට සුදුසු තත්ත්වයේ පානීය ජලය සැපයීමටත්, ජලය බෙදා හැරීම කාර්යක්ෂමව සිදු කිරීමටත් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0963/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමු කලපුවට සී ප්ලේන් ගොඩ බැස්සවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එයට යටත් වන කලපුවේ ඉඩ ප්‍රමාණය කොපමණද;

(iii) මේ සඳහා යොදා ගැනීමට නියමිත ප්‍රදේශය පළල්කර ගැඹුරු කළ යුතු ප්‍රමාණය කවරේද;

(iv) එයට යටත් වන කොටස සම්පූර්ණ කලපුවෙන් ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජල ජීවී විවිධත්වයක් සහිත වූ මීගමු කලපුව එකී ව්‍යාපෘතිය හේතුවෙන් විනාශ මුඛයට පත් නොවන්නේද;

(ii) ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය අවසර දී තිබේ ද;

(iii) එසේ නම්, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙවැනි ව්‍යාපෘතියක් සඳහා විකල්ප ස්ථාන තිබිය දී රටේ ආර්ථිකයට මහඟු අත්වැලක් වන මීගමු කලපුව ඒ සඳහා තෝරා ගැනීමට හේතු කවරේද;

(ii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහොත් අසරණභාවයට පත්වන ධීවරයන් පිළිබඳ සළකා බලා සුදුසු වෙනත් ස්ථානයක් තෝරා ගැනීම සඳහා අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1099/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ කීර්තිමත් ජාතික පාසලක් වන කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ හය වැනි ශ්‍රේණිය සඳහා පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත් සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදයෙහි අක්‍රමිකතා සිදු වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2006 ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන්ගෙන් එම පාසල සඳහා සිසුන් තෝරා ගැනීමට නියමිත වූ කඩ ඉම් ලකුණු මට්ටම කොපමණද;

(ii) කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ හය වැනි ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම ක්‍රමවේදයට පටහැනිව යමින් 2006 ශිෂ්‍යත්ව විභාගය සමත් නොවූ සිසුන් පාසලට ඇතුළත් කර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) එම සිසුන් පාසලට බඳවා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0765/'10

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සිය මෙහෙයුම් ආරම්භකළ දිනය, ඒ සඳහා යොදවන ලද ආරම්භක ප්‍රාග්ධනය සහ අද වනවිට ආයෝජනය කර ඇති මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(ii) අයවැය ලේඛන මගින් මිහින් එයාර් ගුවන් සේවය සඳහා ලබාදෙන ලද මුදල් ප්‍රමාණයන් සහ එලෙස මුදල් වෙන්කර දෙන ලද දිනයන් කවරේද;

(iii) එම ගුවන් සේවයේ ගිණුම්වලින් කපා හරිනලද මුදල් ප්‍රමාණය සහ එලෙස මුදල් කපා හැරීම සිදුකළ දිනය කවරේද;

(iv) ණය වශයෙන් ලබාදෙන ලද ප්‍රාග්ධනය සහ එලෙස ණය ප්‍රදානය කරන ලද බැංකුවල නම් සහ ණය ප්‍රදානය කරන ලද දින කවරේද;

(v) වසරකට ණය ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මිහින් එයාර් ගුවන් සේවය මගින් වසරකට ප්‍රවාහනය කරනු ලබන මුළු මගීන් සංඛ්‍යාව සහ භාණ්ඩ ටොන් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට එකී ගුවන් සේවය මගින් වසරකට උපයනු ලබන ආදායම කොපමණද;

(iii) මිහින් එයාර් ගුවන් සේවය ලාභදායී මට්ටමකින් පවත්වා ගෙන යාමට ප්‍රවාහනය කළ යුතුව තිබෙන මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) අද වනවිට එකී ගුවන් සේවය මගින් ප්‍රවාහනය කිරීමට සමත්ව ඇති මගී සංඛ්‍යාව හා භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජය මිහින් එයාර් ගුවන් සේවය සඳහා කිසියම් බැංකු ඇපකර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවායේ වටිනාකම සහ ඒවා ලබාදීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0941/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමූ හෝ අඩක් නිම කරන ලද ගොඩනැගිලි සහිත ජාතික පාසල් සහ පළාත් සභා පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල නම් සහ ලිපිනයන්;

(iii) මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතුවූ කරුණු;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම තුළින් අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනයක් සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0964/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 තුළදී කොළඹ ජාතික කෞතුකාගාරය සතු අබලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එහිදී වෙන්දේසි කළ භාණ්ඩ කවරේද;

(iv) වෙන්දේසි කරන අවස්ථාවේ දී එම භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය කවරේද;

(v) එම වෙන්දේසිය සඳහා අමාත්‍යාංශ අවසරය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වෙන්දේසියේ දී එක් එක් භාණ්ඩය වෙන්දේසි වූ මිල ගණන් කවරේද;

(ii) භාණ්ඩ මිල දී ගත් අයගේ නම් කවරේද;

(iii) භාණ්ඩ මිලදී ගැනීමට කෞතුකාගාර සේවකයින් සෘජුව හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධ වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පාවිච්චි කළ හැකි ඉතා වටිනා භාණ්ඩ අබලි ද්‍රව්‍ය ලෙස නම් කර එම අවස්ථාවේදී වෙන්දේසි කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1100/’11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ප්‍රභූවරුන් සඳහා වෙන් වී ඇති පර්යන්තය (VIP) භාවිතා කිරීමට සුදුසු වන පුද්ගලයෝ කවරුන්ද;

(ii) ඊට අමතරව VIP පර්යන්තය භාවිත කිරීමට අවස්ථාව ලබා දිය හැකි වෙනත් පුද්ගලයන් කවරුන්ද;

(iii) ඉහත (i) සහ (ii) හි සඳහන් පුද්ගලයන් හැරෙන්නට VIP පර්යන්තය භාවිතා කරන වෙනත් පුද්ගලයෝ සිටින්නේද;

(iv) එසේ නම්, පසුගිය වර්ෂය තුළ එම පර්යන්තය භාවිත කළ එවැනි අයගේ නම් කවරේද;

(v) එම පුද්ගලයන් සඳහා VIP පර්යන්තය භාවිතා කිරීමට අවස්ථාව සලසා දුන් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?